ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

**පුවත්පත් නිවේදනය**

**<u>NCGG – SLIDA පස් වන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන තුළින් 'ක්ලීන් ශ්‍රී ලංකා' සහ ඉන්දියාවේ 'ස්වච්චතා හි සේවා' වැඩසටහන් සඳහා සවියක්</u>**

ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් 2025 ජනවාරි 01 වන දින නිවේදනය කරන ලද 'ක්ලීන් ශ්‍රී ලංකා' වැඩසටහන සහ ඉන්දියාවේ 'ස්වච්ච් භාරත්' මෙහෙයුම යටතේ ක්‍රියාත්මක 'ස්වච්චතා හි සේවා' වැඩසටහන හා සුසංයෝගී වෙමින්, ශ්‍රී ලංකාවේ සිවිල් සේවා නිලධාරීන් 40 දෙනෙක් 2025 සැප්තැම්බර් 22 වන දින සිට ඔක්තෝබර් 03 වන දින දක්වා ඉන්දියාවේ යහ පාලනය සඳහා ජාතික මධ්‍යස්ථානයේ (NCGG) පැවති විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහනක් සඳහා සහභාගී වූහ. මෙම වැඩසටහන "නාගරික ශ්‍රී ලංකාව කලාපීය පිළිවෙත් සමඟින් පරිවර්තනය කරමින් පිරිසිදු නගරයක් සහ වඩාත් යහපත් අනාගතයක් ගොඩනගමු" යන තේමාව යටතේ පැවැත්විණ.

2. දෙරටෙහිම ජාතික වැඩසටහන්වල අරමුණු පිළිබිඹු කරමින් තිරසාර නාගරික කළමනාකරණය, පාරිසරික වගකීම සහ පුරවැසි සහභාගිත්වය යන අංශ සඳහා සහයෝගය ලබා දෙමින් මෙම තේමාව තෝරා ගෙන තිබිණ. ශ්‍රී ලංකා නිලධාරීහු නාගරික සැලසුම් සහ නාගරික පාලනය, නාගරික ක්ෂේත්‍රය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන්, ප්ලාස්ටික් කසළ ප්‍රතිචක්‍රීකරණය වෙත අවධානය යොමු කරමින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රාදේශීය මට්ටමින් නව්‍යකරණය සහ ඩිජිටල් පරිවර්තනය සහ නාගරික ප්‍රවාහනය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර ආවරණය කරමින් ප්‍රවීණයන් විසින් මෙහෙයවන සැසි සඳහා සහභාගී වූහ.

3. වැඩසටහන අතරතුර ක්ෂේත්‍ර චාරිකා ද සංවිධානය කර තිබූ අතර ඒවා තුළින් වැඩසටහනේ තේමාවට අදාළව නාගරික කටයුතු පිළිබඳ ජාතික ආයතනය, මසූරි-ඩෙහෙරාඩූන් සංවර්ධන අධිකාරිය, ඒකාබද්ධ ගෝත්‍රික සංවර්ධන ඒජන්සිය, ටෙහෙකාන්ද් කසළ-බලශක්ති ව්‍යාපෘතිය සහ දිල්ලි මෙට්‍රෝ දුම්රිය ව්‍යාපෘතිය වැනි ප්‍රමුඛ පෙළේ ආයතනවල ප්‍රධාන මුලපිරීම් සම්බන්ධයෙන් ප්‍රායෝගික දැනුම සහ අත්දැකීම් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා දූත පිරිසට මේ තුළින් නාගරික පාලනය, නාගරික යටිතල පහසුකම්, කසළ බලශක්ති ප්‍රභවයක් ලෙස භාවිතා කළ හැකි ආකාර සහ පුරවැසියා කේන්ද්‍ර කරගත් පොදු සේවා යනාදිය තුළ නව්‍ය පිළිවෙත් සම්බන්ධයෙන් වටිනා දැනුම් සම්භාරයක් ලබා ගත හැකි විය.

4. මෙය වසර පහක් පුරා ශ්‍රී ලංකාවේ සිවිල් සේවා නිලධාරීන් 1500ක් පුහුණු කිරීම සඳහා ඉන්දියාවේ යහපාලනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා සංවර්ධන

පරිපාලන ආයතනය (SLIDA) අතර 2024 දෙසැම්බර් මස අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ පවත්වන ලද පස් වන ධාරිතා ගොඩනැගීමේ වැඩසටහනයි. මෙම වැඩසටහනත් ඇතුළත්ව අවබෝධතා ගිවිසුම යටතේ මේ දක්වා නිලධාරීන් 201 දෙනෙකුට පුහුණුව ලබා දී ඇත. සහභාගී වූවන්ගේ ධනාත්මක ප්‍රතිචාර සහ ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත පදනම්ව තවත් ශ්‍රී ලංකා සිවිල් සේවා නිලධාරීන් 40 දෙනෙකු සඳහා අවබෝධතා ගිවිසුම යටතේ සය වන වැඩසටහන ද මෙම තේමාව යටතේ ම සංවිධානය කෙරෙනු ඇත.

***

**කොළඹ**
***2025 ඔක්තෝබර් 04***